සැ.යු.- 2016.03.24 දින පළ වූ අංක 1,960 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,961 - 2016 අප්‍රේල් මස 01 වැනි සිකුරාදා - 2016.04.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 748 | පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 750 | අයවැය ලේඛන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | 754 |


සැ. යු. - ''මාතර සමය'' සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 ජනවාරි මස 01 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 අප්‍රේල් මස 22 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 අප්‍රේල් මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## මහර ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මහර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා බස්නාහිර පළාත තුළ පදිංචි සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු අංකය* | *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය (මාසිකව)* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 02 | වැඩ ක්ෂේත්‍ර කම්කරු | 03 | රු. 11,730 - 10 x 120 - 10 x 130- 10 x 145 -12 x 160 - රු. 17,600 (PL 1-2006 A) | 8 වැනි ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය. |

02. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
(ii) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්නයේ වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.
(iii) අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයෙකු සම්බන්ධයෙන් උපරිම වයස් කාණ්ඩය බලනොපානු ඇත.)
(iv) අයදුම්කරු තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.
(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු කරනු ලැබූවකු හෝ රජයේ පළාත් පාලන සේවයෙන් පහ කරනු ලැබූවකු නොවිය යුතු ය.
(vi) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස්කම් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම මහර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

*03. සේවා නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.

(ii) පත්වීමේ දින සිට අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ.

(iii) වැන්දඹු හා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

(iv) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ නියෝගවලටද, බස්නාහිර පළාත් සභාව හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ මහර ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කෙරෙන රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

*04. බඳවා ගැනීමේ ක්‍රමය:*

1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගැනේ.

2. අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතු ය.

අයදුම්පත් සමඟ පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතු යි.

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතික;
3. පදිංචිය සනාථ කිරීමේ සහතිකය;
4. මෑතකදී ලබාගත් ග්‍රාමසේවා සහතිකය ;
5. මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (02)ක්;
6. වෙනත් සුදුසුකම් දක්වෙන සහතික;
7. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික.

*05. අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි 12" x 8" ප්‍රමාණයේ අයදුම්පත් සකස්කර ඉල්ලුම් කරන තනතුර අදාළ කවරයේ වම්පස ලියා 2016.04.22 වැනි දිනට පෙර ලේකම්, මහර ප්‍රාදේශීය සභාව, පහළකරගහමුණ, කඩවත යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය) නියමිත දිනෙන් පසු ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එස්. ඒ. කේ. එන්. ඉන්දජිත්,
ලේකම් හා සභාවේ බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
මහර ප්‍රාදේශීය සභාව.

2016 ක් වූ මාර්තු මස 16 වැනි දින,
මහර ප්‍රාදේශීය සභාව,
පහළ කරගහමුණ,
කඩවත.

ආදර්ශ අයදුම් පත්‍රය

**මහර ප්‍රාදේශීය සභාව**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ .................................... තනතුර සඳහා බඳවා ගැනීම***

01. මුලකුරු සමග නම :——————.

මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————.

02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————.

03. ස්ථිර ලිපිනය :——————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය :——————.

05. උපන් දිනය:——————.

2016.04.22 වැනි දිනට වයස අවුරුදු :—————— මාස:—————— දින:——————.

06. ජාතික හැඳුනුම්පත් අංකය :

07. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද/ලියාපදිංචි වීමෙන්ද? :——————.

08. (i) අධ්‍යාපන සුදුසුකම් :

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

(ii) වෙනත් සුදුසුකම් : ——————.

09. වෘත්තියමය සුදුසුකම් : ——————.

10. සේවා පළපුරුද්ද :

(i) දැනට දරන තනතුර : ——————.
(ii) එම තනතුරට පත් වූ දිනය: ——————.
(iii) එම තනතුරේ සේවා කාලය: ——————.
(iv) මීට පෙර සේවය කරන ලද ස්ථාන හා දරන ලද තනතුරු: ——————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය අනුව සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බව මා තෝරා ගැනීමට පෙර හෝ පසුව හෙළිවුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දන්වමි.

____________,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ——————.

*දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ...............................මහතා/මහත්මිය/මෙනෙවිය දැනට මෙම කාර්යාලයේ ...............................තනතුරේ ...............................දින සිට සේවය කරයි. අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි./නොකරමි.

____________,
ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය: ——————.

04-232

---

# පළාත් පාලන නිවේදන

## කටාන ප්‍රාදේශීය සභාව

ගෝඝාතක ආඥාපනත (272 වැනි අධිකාරිය)

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අය එහි සඳහන් වන ස්ථානයේ 2016 වර්ෂයේ, ගවමස්, ඌරු මස් සහ එළුමස් වෙළඳාම් කරගෙන යාම සඳහා බලපත්‍ර ලබා ගැනීමට ඉදිරිපත් වී සිටින බව ගෝඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරිය) 2 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම බලපත්‍රය නිකුත් කිරීම පිළිබඳව කටාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි අයෙකු විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය ඊට විරුද්ධ වන්නේ කුමන කාරණයක් සඳහාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව මෙයින් දන්වමි.

එච්. එම්. අරුණි ද සිල්වා,
ලේකම්,
කටාන ප්‍රාදේශීය සභාව.

2016 පෙබරවාරි මස 25 වැනි දින,
කටාන ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය,
දෙමංහන්දිය.

*උපලේඛනය*

| | *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *මස්කඩය පවත්වන ස්ථානය* | *වෙළඳාම* |
|---|---|---|---|
| 01 | ඩබ්. ඒ. එම්. තිසේරා බෙලගවත්ත, කටාන | නැගෙනහිර කටාන මස්කඩය | හරක්මස්/ඌරුමස් |
| 02 | මර්සන් අජිත් බම්බුකුලිය, කොච්චිකඩේ | බම්බුකුලිය අංක 02 මස් කඩය | හරක්මස්/ඌරුමස් |
| 03 | ප්‍රියංගිකා කොස්තා, අංක 255, කොන්දගම්මුල්ල, දෙමංහන්දිය | කඳවල අංක 02 මස් කඩය | හරක්මස්/ඌරුමස් |
| 04. | ආර්. එම්. රනිල් රොෂාන් අංක 104, කෝන්ගොඩමුල්ල, කටාන | ආඬිඅම්බලම මස් කඩය | ඌරු මස් |
| 05. | කේ. ලීලානි ධම්මිකා අංක 21, කෝන්ගොඩමුල්ල, කටාන | කදිරාන මස් කඩය | හරක්මස්/ඌරුමස් |

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | මස්කඩය පවත්වන ස්ථානය | වෙළඳාම |
|---|---|---|---|
| 06. | සුමිත් අසංක අංක 169/ඒ/2 කයිතානු මාවත, කොටුගොඩ | කොටුගොඩ මස් කඩය | හරක්මස්/ඌරුමස් |
| 07. | මොහොමඩ් හනීෆා හජ්රා මාවත, ගල්ඔලුව, මිනුවන්ගොඩ | ආඬිඅම්බලම මස් කඩය | හරක්මස් |
| 08. | ආර්. එම්. මේරි මාග්‍රෙට් අංක 485/3, කෝන්ගොඩමුල්ල, කටාන | කිඹුලාපිටිය මස් කඩය | හරක්මස්/ඌරුමස් |
| 09. | එම්. ආර්. ආර්. සිල්වා දෙල්ගස් හන්දිය, කටාන | බටහිර කටාන මස් කඩය | හරක්මස්/ඌරුමස් |
| 10. | එල්. ප්‍රියංගනී මංජුලා ප්‍රනාන්දු, අංක 521/5, ලියෝ මාවත, කෝන්ගොඩමුල්ල, කටාන | කොන්දගම්මුල්ල ඌරු මස්කඩය | ඌරු මස් |
| 11. | ටී. ස්ටීවන් පෙරේරා, අංක 201/8, ජුබිලි මාවත, කදවල, කටාන | ඇත්ගාල අංක 02 මස් කඩය | හරක්මස්/ඌරුමස් |
| 12. | එම්. ඒ. ඒ. මුයිස් 2බී/117 එල්, ජාතික නිවාස යෝජනා ක්‍රමය, රද්දොළුව | 2එම් 3 මස් කඩය ජාතික නිවාස යෝජනා ක්‍රමය | හරක්මස් |
| 13. | ආර්. එම්. අයි. ප්‍රදීප් කුමාර, 534/5, ලියෝ මාවත, කෝන්ගොඩමුල්ල, කටාන | ගම්සභා හන්දිය | හරක්මස්/ඌරුමස් |
| 14. | ඒ. ජෝසප් ප්‍රනාන්දු බම්බුකුලිය, කොච්චිකඩේ | බම්බුකුලිය අංක 01 | හරක්මස්/ඌරුමස් |
| 15. | ආර්. එම්. පී. ජයන්ත රුවන් ෆොන්සේකා 545/1/ඒ ලියෝ මාවත, කෝන්ගොඩමුල්ල, කටාන | කටුවපිටිය පල්ලිය අසල | හරක්මස්/ඌරුමස් |
| 16. | එම්. එස්. එම්. රියාස් රසීක් හරිඩ් මාවත, මීගමුව | මහහුණුපිටිය මස් කඩය | හරක් මස් |

04-129

---

**මාතර මහා නගර සභාව**

1957 අංක 17 දරන සමාජ ශාලාවට බලපත්‍ර දීමේ පනත

මෙකී පහත උපලේඛනයේ සඳහන් තැනැත්තන් විසින් ඔහුගේ නම ඉදිරියෙන් දැක්වෙන සමාජශාලාවලට එහි සඳහන් ස්ථානයෙහි නැවැත්වීම සඳහා 2016 වර්ෂයට බලපත්‍ර ලබා ගැනීම සඳහා මා වෙත ඉල්ලුම්පත් ඉදිරිපත් කොට ඇති බව 1975 අංක 17 දරන සමාජශාලාවලට බලපත්‍රදීමේ පනතේ (6) වැනි වගන්තියේ (ඇ) ඡේදය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සමාජ ශාලා අසල හෝ එකී සමාජ ශාලා සඳහා අපේක්ෂිත ස්ථානය අදාළ හෝ පදිංචි යම් තැනැත්තකු එම ක්‍රීඩා සමාජශාලා සඳහා බලපත්‍ර නිකුත් කිරීම ගැන විරුද්ධ වන්නේ නම් එම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට සති 04 ක් ඇතුළත තමාගේ විරුද්ධත්වයට හේතු ලිඛිතව පිටපත් 02 කින් යුක්තව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

නාගරික කොමසාරිස්,
මාතර මහා නගර සභාව.

2016 මාර්තු මස 10 වැනි දින,
මාතර මහා නගර සභා කාර්යාලය.

උපලේඛනය

| *අයදුම්කරුගේ නම* | *සමාජශාලාවේ ලේකම්/ සභාපති/කළමණාකරු* | *සමාජශාලාවේ නම* | *සමාජ ශාලාවේ කටයුතු කරගෙන යන ස්ථානය* |
|---|---|---|---|
| 1. ජේ. ඩී. දහම්සිරි | ලේකම් | රුහුණු ක්‍රීඩා සමාජය | අංක 50, සමූපකාර මන්දිරය, දුම්රියපොල පාර, මාතර. |

04-287

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

ගෝසාතක ආඥා පනත (272 වැනි අධිකාරිය)

මෙහි උපලේඛනයෙහි සඳහන් අය විසින් ඒ අයගේ නම ඉදිරියෙන් සඳහන් ගෝසාතකාගාරයේ මස් පිණිස සතුන් ඝාතනය කිරීමටත්, නම ඉදිරියෙන් සඳහන් මස් වෙළඳ සැලෙහි මස් වෙළඳාම් කිරීමටත් 2016 වර්ෂය සඳහා බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බව ගෝසාතක ආඥාපනතේ (272 වැනි අධිකාරිය) 7/(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම බලපත්‍රය නිකුත් කිරීම සඳහා විරෝධතාවයන් දැන්වීමට අදහස් කරන උඩුනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම අයකුට ඔහුගේ/ඇයගේ විරෝධතාවය සඳහා හේතුව දන්වමින් පිටපත් දෙකකින් යුතු ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින දහහතරක් (දින 14 ක්) ඇතුළත මා වෙත එවන ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

ජී. යූ. ගුණසිංහ,<br>
ලේකම්,<br>
උඩුනුවර ප්‍රාදේශීය සභාව,<br>
ගෙලිඔය.

2016 පෙබරවාරි මස 26 වැනි දින,<br>
ගෙලිඔය පිහිටි උඩුනුවර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

**2016 වසරේ ගව මස් වෙළඳාම සඳහා තාවකාලික බලපත්‍ර ලබා දුන් අයගේ නාම ලේඛනය**

| අනු අංකය | නම සහ ලිපිනය | වෙළඳ ස්ථානයේ ලිපිනය | වෙළඳාම් කරන කරනු ලබන ද්‍රව්‍ය | ප්‍රවාහනය කරනු ලබන වාහන අංකය |
|---|---|---|---|---|
| 01 | එච්. එල්. එම්. නවුෂාඩ් මයා<br>අංක 234, අප්පල්ලාගොඩ බටහිර, වටදෙණිය. | අංක 5/2, රූකවල්පොළ, වටදෙණිය,<br>138/සී, දවුලගල, හන්දෙස්ස | ගවමස් වෙළඳාම | CPAAL 2196 |
| 02 | එම්. එම්. ඉක්බාල් මයා<br>157, පැණිදෙණිය. පේරාදෙණිය | 135, දවුලගල, හන්දෙස්ස, ඝාතකාඝාරය,<br>195/1, දවුලගල, හන්දෙස්ස | ගවමස් වෙළඳාම | NWYK 8965<br>CPLA 4168 |
| 03 | එම්. එස්. එන්. මොහොමඩ් මයා<br>479/3/1, කළුගමුව, ගෙලිඔය | අංක 16, කළුගමුව පාර, ගෙලිඔය.<br>අංක 256, පට්ටියාවත්ත, දෙල්තොට | ගවමස් වෙළඳාම | CPLC 4290<br>CPLH 2748 |
| 04 | ඒ. එන්. හසන් මයා<br>133/ඩී, දුම්පලංග, හන්දෙස්ස | 211/1, දවුලගල, හන්දෙස්ස<br>375, දුම්පල්අංග, හන්දෙස්ස | ගවමස් වෙළඳාම | AAD 2992 |
| 05 | ඒ. එම්. ජාකීර් මයා<br>130/ඒ, කුරුකුත්තල, කඩුගන්නාව | 130/ඒ, කුරුකුත්තල, කඩුගන්නාව<br>252/1, රූකවල්පොළ, වෙළම්බොඩ | ගවමස් වෙළඳාම | CPAAY 3603<br>CPAAD 3232 |
| 06 | එම්. එෆ්. එච්.සියාන් මයා<br>අංක 07, දොඹගොල්ල, මුරුතගහමුල | 383, කගුරන්කෙතවත්ත, බූවැලිකඩ<br>පැරණි වෙළඳ සංකීර්ණය, කඩුගන්නාව | ගවමස් වෙළඳාම | CPLA 4168<br>WWLE 2452 |
| 07 | එම්. එස්. එම්. සිද්දික් මයා<br>490/2/ඩී, කළුගමුව, ගෙලිඔය | 330, පල්ලිය පාර, දෙල්ලංග දෙහිපාගොඩ,<br>256, පට්ටියාගම, දෙල්තොට | ගවමස් වෙළඳාම | CPLC 1215<br>CPLC 4290 |
| 08 | ඒ. එම්. එම්. රියාස් මයා<br>195, මාහිංගොඩ, හන්දෙස්ස | 209, දවුලගල, හන්දෙස්ස<br>195/1, මාහිංගොඩ, හන්දෙස්ස | ගවමස් වෙළඳාම | QJ - 9265<br>GF - 9353 |
| 09 | එම්. එච්. අයිශා උම්මා මයා<br>115, වෙළම්බොඩ | 48, නුවරපාර, වෙළම්බොඩ<br>සියඹලාගහමුලවත්ත, වෙළම්බොඩ | ගවමස් වෙළඳාම | CPAAH 9629<br>PQ - 5194 |
| 10 | එම්. ඒ. සාජිත් අහමඩ් මයා<br>29/6, රූකවල්පොළ, වෙළම්බොඩ | 58/බී, කුරදෙණිය පාර, වෙළම්බොඩ<br>252/1, රූකවල්පොළ, වෙළම්බොඩ | ගවමස් වෙළඳාම | PQ - 5194 |

| අනු අංකය | නම සහ ලිපිනය | වෙළඳ ස්ථානයේ ලිපිනය | වෙළඳාම් කරන කරනු ලබන ද්‍රව්‍ය | ප්‍රවාහනය කරනු ලබන වාහන අංකය |
|---|---|---|---|---|
| 11 | ඒ. ෆාරුක් මයා<br>133/ඩී, දුම්පලංග, හන්දෙස්ස | 161/බී, බුවැලිකඩ, ලීමගහකොටුව | ගවමස් වෙළඳාම | CPAAH - 9629<br>PQ - 5194 |
| 12 | එස්. එම්. එම්. අස්මි මයා<br>49/සී, දස්කර, මුරුතගහමුල | 330, බුවැලිකඩ, ලීමගහකොටුව<br>පැරණි වෙළඳ සංකීර්ණය, කඩුගන්නාව | ගවමස් වෙළඳාම | CPLA - 4168<br>NWLE - 2402 |
| 13 | එන්. එයි. එන්. නිෂාම් මයා<br>207/10, වටදෙණිය, වෙළම්බොඩ | අටලහතැන්නවත්ත, 141, වෙළම්බොඩ,<br>සියඹලාගහමුලවත්ත, වෙලම්බොඩ | ගවමස් වෙළඳාම | PQ - 5194<br>CPAAH - 9629 |
| 14 | එම්. එෆ්. එම්. සාදික් මයා<br>528/2, නිව්ඇල්පිටිය, | 6/බී, කළුගමුව, ගෙලිඔය<br>135, දවුලගල, හන්දෙස්ස | ගවමස් වෙළඳාම | CPLA - 4168<br>NWYK - 8965 |

**2016 වසරේ එළු මස් වෙළඳාම සඳහා තාවකාලික බලපත්‍ර ලබා දුන් අයගේ නාම ලේඛනය**

| අනු අංකය | නම සහ ලිපිනය | වෙළඳ ස්ථානයේ ලිපිනය | වෙළඳාම් කරන කරනු ලබන ද්‍රව්‍ය | ප්‍රවාහනය කරනු ලබන වාහන අංකය |
|---|---|---|---|---|
| 01 | එම්. ඉසඩ්. එච්. මුස්තාක් මයා<br>426, නව ඇල්පිටිය, ගෙලිඔය | අංක 19, කළුගමුව පාර, ගෙලිඔය | එළු මස් වෙළඳාම | අංක 426, නව ඇල්පිටිය,<br>ගෙලිඔය |

**ගව ඝාතකාගාර**

| අනු අංකය | නම සහ ලිපිනය | වෙළඳ ස්ථානයේ ලිපිනය | සිදු කරන කාර්යය |
|---|---|---|---|
| 01 | ෆාතිමා රිෂානා මිය,<br>133, දුම්පලංග, හන්දෙස්ස | 375, දුම්පලංග, හන්දෙස්ස | ගෝඝාතකාගාරය |
| 02 | එච්. අයිෂා උම්මා මිය<br>අංක 115, නුවරපාර, වෙළම්බොඩ | සියඹලාගහමුලවත්ත, වෙළම්බොඩ | ගෝඝාතකාගාරය |
| 03 | එච්. එම්. ඉක්බාල් මයා | 195/1, දවුලගල, හන්දෙස්ස | ගෝඝාතකාගාරය |
| 04 | එම්. ඒ. සාජිත් අහමඩ් මයා | 252/1, රූකවල්පොළ, හන්දෙස්ස | ගෝඝාතකාගාරය |

**එළු ඝාතකාගාර**

| අනු අංකය | නම සහ ලිපිනය | වෙළඳ ස්ථානයේ ලිපිනය | සිදු කරන කාර්යය |
|---|---|---|---|
| 01 | එම්. අයි. එච්. මුස්තාක් මයා | 456, නවඇල්පිටිය, ගෙලිඔය | එළු ඝාතකාගාරය |

04-185

# විවිධ දැන්වීම්

## දික්වැල්ල ප්‍රාදේශීය සභාව

### ප්‍රාදේශීය සභා ක්‍රීඩා භූමිය බදු දීම - 2016 වර්ෂය

පළාත් පාලන ආයතනවල නිල කාලය 2015 මැයි මස 15 වැනි දින අවසන් වී ඇති හෙයින් ප්‍රාදේශීය සභා සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9:3 වගන්තිය ප්‍රකාරව ලේකම්වරයා වෙත ලැබී ඇති බලතල අනුව තීරණ අංක 91 යටතේ පහත දැක්වෙන යෝජනාව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. එස්. රත්නවීර,
ලේකම්,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

2016 ජනවාරි මස 04 වැනි දින,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

**යෝජනාව**

2016 වර්ෂය සඳහා දික්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් ප්‍රාදේශීය සභාව සතු ක්‍රීඩා භූමිය බදු දීමේදී පහත පරිදි ගාස්තුවක් ගෙවිය යුතු බවට යෝජනා කරමි.

| | | රු. | ශත |
|---|---|---|---|
| * | ක්‍රිකට් හෝ වෙනත් තරඟාවලි සඳහා | 1,000 | 0 |
| * | ප්‍රදර්ශන සඳහා | 1,000 | 0 |
| * | දේශපාලන හෝ වෙනත් රැස්වීම් සඳහා | 1,000 | 0 |
| * | වෙනත් විවිධ උත්සව කටයුතු සඳහා | 1,000 | 0 |
| * | මුදල් අය කිරීමකින් තොරව පවත්වන සංගීත සංදර්ශන සඳහා (තැන්පතුව රු. 10,000) | 10,000 | 0 |
| * | මුදල් අයකර පවත්වන සංගීත සංදර්ශන සඳහා (තැන්පතුව රු. 10,000) | 20,000 | 0 |

04-276

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2014 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

***සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.***

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | *රු. ශ.* |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | ...137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* | |
|---|---|---|---|
| I වැනි කොටස : | | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 | |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 | |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 | |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 | |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 | |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 | |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 | |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 | |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

*** කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.**

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2016** | | | |
| **අප්‍රේල්** | 2016.04.01 | සිකුරාදා | 2016.03.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.04.08 | සිකුරාදා | 2016.03.24 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2016.04.15 | සිකුරාදා | 2016.04.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.04.22 | සිකුරාදා | 2016.04.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.04.29 | සිකුරාදා | 2016.04.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මැයි** | 2016.05.06 | සිකුරාදා | 2016.04.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.05.13 | සිකුරාදා | 2016.04.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.05.20 | සිකුරාදා | 2016.05.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.05.27 | සිකුරාදා | 2016.05.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ජුනි** | 2016.06.03 | සිකුරාදා | 2016.05.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.06.10 | සිකුරාදා | 2016.05.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.06.17 | සිකුරාදා | 2016.06.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.06.24 | සිකුරාදා | 2016.06.10 | සිකුරාදා | දහවල් | 12.00 |

**ඩබ්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.).*

2016 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.